**<u>2020 යල කන්නය සඳහා වගා කාල සටහන තීරණය කිරීම - මී ඔය ව්‍යාපාරය</u>**

1994 අංක 13 දරණ සංශෝධිත පනත යටතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තියයටතේ මී ඔය ව්‍යාපාරය වෙනුවෙන් 2020යල කන්නය සඳහා පහත පරිදි වගා කාලසටහන සකස් කරණ ලදී.

| අනු අංකය | විස්තරය | තීරණ | | |
|---|---|---|---|---|
| | | අඹකොළවැව | අතරගල්ල | පාළුකඩවල |
| 01 | වගා කිරිමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්කර 436 | අක්කර 250 | අක්කර 800 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | වගා කිරිමට අපේක්ෂිත බෝග වර්ගය | • වී මාස 03 හෝ3 1/2<br>• වී අක්කර 416<br>• අතිරේක බෝග - අක්කර 20 (මී ඔයෙන් ජලය ලබා ගෙන) | • වී මාස 03, 3 ½ සහ අතිරේක බෝග අක්කර 250<br>• අතිරේක බෝග අක්කර 30 (මී ඔයෙන් ජලය ලබා ගෙන) | පුරාණගම (අක්කර 400)<br>අක්කර 400 වී<br>**පාළුකඩවල අතිරේක බෝග (අක්කර 400)**<br>යාය 01 - අක්කර 40<br>යාය 02 - අක්කර 137<br>යාය 03 - අක්කර 31<br>යාය 04 - අක්කර 42<br>යාය 05 - අක්කර 75<br>යාය 06 - අක්කර 75 |
| 04 | ගොවීන් විසින් ඇළ වේළි නඩත්තුව අවසන් කළ යුතු දිනය | 2020.03.10 ට පෙර | 2020.03.10 ට පෙර | 2020.03.10 ට පෙර |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ අළවල් ගොවි සංවිධානය විසින් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020.03.13 ට පෙර | 2020.03.13 ට පෙර | 2020.03.13 ට පෙර |
| 06 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන විසින් ප්‍රධාන ඇළවල් /බෙදුම් ඇළවල් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020.03.13 ට පෙර | 2020.03.13 ට පෙර | 2020.03.13 ට පෙර |
| 07 | මුල් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2020.03.15 | 2020.03.15 | 2020.03.10 පාළුකඩවල දෙවන පියවර<br>2020.03.15 පාළුකඩවල පළමු පියවර සහ පුරාණගම |
| 08 | වපුරා හෝ බීජ සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.04.12 | 2020.04.12 | 2020.04.07 පාළුකඩවල දෙවන පියවර<br>2020.04.12 පාළුකඩවල පළමු පියවර සහ පුරාණගම |
| 09 | මුර ජලය ආරම්භ කරන දිනය | 2020.04.15 | 2020.04.15 | 2020.04.15 |
| 10 | අවසන් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2020.07.10 | 2020.07.10 | 2020.07.10 |
| 11 | යායෙන් ගවයින් ඉවත් කළ යුතු දිනය | 2020.04.10 | 2020.04.10 | 2020.04.10 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2020.04.05 | 2020.04.05 | 2020.04.05 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.07.10 | 2020.07.10 | 2020.07.10 |
| 14 | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2020.07.30 | 2020.07.30 | 2020.07.30 |

❖ මෙම යල් කන්නයේ මී ඔය ව්‍යාපාරය තුළ දුම්කොළ වගාව සිදු නොකිරීමට තීරණය විය.

<u>වගා කොන්දේසි</u>

01 කෙත් ඇල සහ බෙදුම් ඇලවල නඩත්තුව සඳහා කන්නයකට අක්කර 01ක් සඳහා රු.300.00ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

02 නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන් විසින් නඩත්තු කළ යුතු අතර නියමිත දිනට නඩත්තු නොකරන කොටස් ගොවි සංවිධානය මගින් නඩත්තු කර නියමිත මුදල ගොවින්ගෙන් අය කර ගැනමට ගොවි සංවිධානයට බලය පැවරේ.(මීටරයට රුපියල් 150 බැගින්)

03 ගවයින් නිසා වගාවට සිදු වන හානි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් හානි පූර්ණය කර ගත යුතුයි.වාරිමාර්ග පද්ධතියට සිදු වන හානි සඳහා වන අලාභය වාරි මාර්ග දෙපාර්තුමේන්තුව මගින් තක්සේරුකර අදාල අයගෙන් අයකරගෙන පද්ධතිය අලුත් වැඩියා කිරීමේ කටයුතු අදාල ගොවි සංවිධානය විසින් ඉටුකළ යුතුය.

04 වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරිමාර්ග නිර්මිතවලට හානි කිරීම සිදු කළ හොත් වාරි මාර්ග පනතට අනුව දඩ අය කිරීමටත් , එසේම එම හානිය වාරි මාර්ග දෙපාර්තුමේන්තුව මගින් තක්සේරු කර තක්සේරු වටිනාකම අය කර ගැනීමටත් අදාල පද්ධතියේ හානි වූ ස්ථාන අලුත් වැඩියා කිරීමේ කටයුතු අදාල ගොවි සංවිධානය විසින් ඉටුකිරීමත් සිදුකළ යුතුය.

05 අනවසරයෙන් ජලය ලබා ගැනිම වරදක් වන අතර එසේ ලබා ගත් ජලය වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ජලයේ වටිනාකම තක්සේරු කර අදාළ වරදකරුගෙන් අය කර ගැනිමට ගොවි සංවිධානයට බලය පැවරේ.

06 අනවසරයෙන් හෝ බලහත්කාරයෙන් ජල පොම්ප භාවිතයෙන් වාරි ජලය ලබා ගෙන රක්ෂිත හෝ ගොඩ ඉඩම් හෝ අනවසර ඉඩම් වගා කිරීම සම්පූර්ණයෙන් තහනම් වන අතර මෙම පුද්ගලයන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය.

**2020 යල් කන්නය සඳහා ඉහත සඳහන් වගා කාල සටහන හා වගා රීති සුදුසු බව පුරාණගම ගොවි සංවිධානයේ ගරු සභාපති ඩබ්.එම්.ඒ.කේ.බී.විජේකෝන් මහතා විසින් කළ යෝජනාව අඹකොලවැව දකුණු ඉවුර ගොවි සංවිධානයේ ගරු සභාපති එන්.පී. හීන්බංඩා මහතා විසින් ස්ථිර කරණ ලදී.**

අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමාගේමුලාසන කතාවෙන් හා ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති ඩබ්.එම්.ඒ.කේ.බී.විජේකෝන් මහතාගේ ස්තුති කතාවෙන් අනතුරුව කන්න රැස්වීමේ කටයුතු අවසන්කරන ලදී.

ජී.ඒ.කිත්සිරි
අතිරේක දිස්ත්‍රික් ලේකම්
කුරුණෑගල

[illegible]
අතිරේක දිස්ත්‍රික් ලේකම් (සංවර්ධන)
දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල වෙනුවට

පිටපත්:-.

1. ලේකම් කෘෂිකර්ම,ග්‍රාමීය ආර්ථිකකටයුතු,පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය :- කාදැස
2. අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :- කාදැස
3. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල :- කාදැස
4. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ - කුරුණෑගල :- කාදැස
5. කෘෂිර්ම අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කුරුණෑගල :-කාදැස
6. නේවාසික ව්‍යාපෘති කළමණාකරු මී ඔය සදහා :-අවශ්‍ය කටයුතු
7. ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ඇහැටුවැව සදහා :-අවශ්‍ය කටයුතු
8. සහකාර අධ්‍යක්ෂ- කෘෂිකර්ම කාර්යාලය ගල්ගමුව සදහා :-අවශ්‍ය කටයුතු
9. සහකාර අධ්‍යක්ෂ ජාතික පොහොර ලේකම් කාර්යාලය කුරුණෑගල සදහා :-අවශ්‍ය කටයුතු
10. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව සදහා :-අවශ්‍ය කටයුතු
11. සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව සදහා :- අවශ්‍ය කටයුතු
12. කෘෂිකර්ම උපදේශක පාලුකඩවල/අඹන්පොල වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය සදහා :-අවශ්‍ය කටයුතු
13. ගොවිජන සංවර්ධන නිලධාරි ගල්ගමුව /නාන්නේරිය/ඇහැටුවැව/අඹන්පොළ :-අවශ්‍ය කටයුතු සදහා
15. පොලිස් ස්ථානාධිපති ගල්ගමුව/අඹන්පොළ :- කාදැස
16. වන ජීවී කාර්යාලය -ගල්ගමුව :- කාදැස